දෙවන කලාපය
ISSN - 1391-6785
# තේ තතු
ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ප්‍රකාශණයකි
පළවෙනි කාණ්ඩය, දෙවෙනි කලාපය 2001 ජුලි - දෙසැම්බර්

# තිරසාර වගාවකට හොඳ ක්ලෝනයක් තෝරමු

මහින්ද රත්නායක

සුළු පරිමාණයෙන් හෝ තේ වගාවක් ආරම්භ කරන ඔබ කුඩා තේ වතු හිමියෙක් යන ගරු නාමය ලබන බව නියතයක්. එතැන් පටන් ඔබ දකින සිහිනය තිරසාර මෙන් ම සරුසාර තේ වත්තක හිමිකරුවෙක් වීම බව නොරහසක්.

ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය මගින් වැඩි දියුණු කල නව ක්ලෝන ශ්‍රේණි නිපදවා ඇති බව මුලින්ම දැන ගත යුතු කරුණක්. තෝරා ගැනීමේදී යම් ක්ලෝනයක් සලකා බැලිය යුතු කරුණු කීපයක් තියෙන බව දැන සිටීම යහපතක්.

- එක් එක් ප්‍රදේශ සඳහා විශේෂිත ක්ලෝන නිර්දේශ කර ඇති බවද,
- එක් එක් ප්‍රදේශ සඳහා ආවේනික රෝග ඇති බවද,
- එක් එක් ප්‍රදේශ වලට ආවේනික පළිබෝධ ඇති බවද,
- ප්‍රදේශයෙන් ප්‍රදේශයට ලැබෙන වර්ෂාපතනයේ වෙනසක් ඇති බවද, සැලකිල්ලට ගනිමින්

පහත සඳහන් ලක්ෂණ එකක් හෝ කීපයක් අනුව ඔබේ වත්තට ගැලපෙන නව ක්ලෝනයක් ඔබටම තෝරා ගත හැකියි.

තෝරා ගත්තොත් ඔබේ වත්තට ගැලපෙන හොඳ ක්ලෝනයක් ඔබේ සිහිනය සැබෑවෙයි නැහැ කිසිම දෝෂයක්.

ඉන් ඇතිවුනොත් ඔබට යම් දියුණුවක් අපිටත් දැනේවි පුංචි සංතෝෂයක්.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3014 | 3014, | 3025 | 3014 | 3072 | 3052 | 3014, 4006, 3072, 4059 | 3019, 4067 | 3014 | 3019 | 3014, 4053 |
| 3017 | 4055 | 3047 | 3016 | 3073 | 4004 | 3019, 4042, 3073, 4067 | 3020, 4078 | 3019 | 3022 | 3022, 4055 |
| 3018 | 3055, 4085 | 3055 | 3017 | 4052 | 4049 | 3020, 4043, 4004, 4078 | 3072, 4079 | 3020 | 4042 | 3025, 4059 |
| 3019 | 4004, 4046 | 4004 | 3019 | 4067 | 4052 | 3022, 4046, 4006, 4079 | 3073, 4085 | 3025 | 4046 | 3047, 4042 |
| 3022 | 4043 | 4049 | 3020 | | 4053 | 3025, 4049, 3055, 4055 | 4006 | 4006 | 4052 | 3052, 4043 |
| 3047 | | 4059 | 3072 | | 4059 | 3047, 4052, 4085, 4053 | 4052 | 4042 | 4053 | 3055, 4046 |
| 4053 | | | 4006 | | 4061 | 3052, 3013 | 4053 | 4046 | 4078 | 4004, 4049 |
| 4067 | | | 4052 | | 3013 | | 3013 | 4053 | 3013 | 4006, 4052 |
| 4078 | | | 4053 | | 3053 | | | | 4071 | |

1. උසස් වර්ගයේ නිමි තේ නිෂ්පාදනය කල හැකි ක්ලෝන
2. කඳ ගුල්ලා හානියට ඔරොත්තු දෙන ක්ලෝන
3. පහතරට සප්වී දැව වේ හානියට ඔරොත්තු දෙන ක්ලෝන
4. නෙමටෝඩාවන්ගේ හානියට ඔරොත්තු දෙන ක්ලෝන
5. බිබිලි අංගමාරයට ඔරොත්තු දෙන ක්ලෝන
6. කඳ පිළිකා වලට ඔරොත්තු දෙන ක්ලෝන
7. නියඟයට ඔරොත්තු දෙන ක්ලෝන
8. උඩරට ප්‍රදේශ සඳහා නිර්දේශිත ක්ලෝන
9. මැදරට ප්‍රදේශ සඳහා නිර්දේශිත ක්ලෝන
10. ඌව සඳහා නිර්දේශිත ක්ලෝන
11. පහතරට ප්‍රදේශ සඳහා නිර්දේශිත ක්ලෝන